# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.10.04

වර්ෂ 2022 ක් වූ ඔක්තෝම්බර් මස 04 වන අඟහරුවාදා දින ප.ව. 02.00 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ විශේෂ මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**විශේෂ මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
06. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
08. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
10. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
11. ගරු මන්ත්‍රිනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
12. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
13. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
14. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
15. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් විශේෂ මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ෑ- නැත**

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ෑ- නැත**

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ෑ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ෑ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** අප ප්‍රාදේශීය සභාව මගින් සිට්ට්‍රස්වත්තේ ඉදිකරනු ලබන ද්විත්ව කුටීර ආදාහනාගාරයේ ඉතිරි වැඩ කොටස් සඳහා නර්ඩ් ආයතනය මගින් නව මිල ගණන් අනුව සකස්කර ඇති රු. 66,227,589.20 ක ඇස්තමේන්තුව අනුමත කිරීමටත්, එම ඇස්තමේන්තුව අනුව පුවත්පත් දැන්වීම් පළකොට විවෘත ටෙන්ඩර් කැඳවා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ප.ව 02.30 ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සහ ප.ව 03.10ට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

සිට්ට්‍රස්වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිරිකිරීමට අදාළව මෙතෙක් සිදුකරන ලද සංවර්ධන කටයුතු සඳහා කරන ලද ගෙවීම් පිළිබඳව විස්තර ගරු සභිකවරුන්ගේ දැනගැනීම පිණිස ලබාදී මෙම යෝජනාව ඉදිරි මහා සභා රැස්වීමට සභා සම්මත කර ගැනීමට ඉදිරිපත් කරන ලෙස ගරු සභිකවරුන්ගේ ඉල්ලීම් සලකා බලන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ඉහත යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ- නැත**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ- නැත**

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**I. පහත සඳහන් කරුණු සාකච්ඡා කොට තීන්දු තීරණ ගැනීම.**

**01. කපුහෙම්පල නීති විරෝධි ලෙස අවසතු කරන ලද නන්දිමිත්‍ර විද්‍යාලීය භූමිය සම්බන්ධව**

කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව තිබී අවසතු වූ ඉඩම සංවර්ධනය සඳහා අවසර ලබා දී නැති බවත්, මෙම සභා වාරයට පෙර එම ඉඩම සඳහා ලබාදී තිබූ සංවර්ධන බලපත්‍රය ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති ධූරයට පත්වූ පසු අවලංගු කොට ඒ පිළිබඳව බැනර් එකක් මගින් අදාළ ඉඩමේ ප්‍රදර්ශනය කළ බවත්, මෙම ඉඩම අවසතු වීමට අදාළ සියළු විස්තර ඇතුළත් ලිපිගොනුවක් තමා සතුව ඇති බවත්, මෙම අවසතු වූ ඉඩම නැවත රජයට පවරා ගැනීමට සභාවට යෝජනාවක් ඉදිරිපත්කොට සභා සම්මත කොටගෙන අතිගරු ජනාධිපතිතුමා වෙත සහ ගරු අගමැතිතුමා වෙත යැවිය යුතු බවත් ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාවට තමා එකඟ බවත්, මෙම ඉඩම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමක් වුවද එය සභාවට අයිතිය තිබූ ඉඩමක් නොවන බවත්, මෙම ඉඩමට ලබාදී තිබූ සංවර්ධන බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධයෙන් දැනට කොළඹ අභියාචනාධිකරණයේ තමාට විරුද්ධව නඩුවක් විභාග වන බවත්, කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව තිබී අවසතු වූ ඉඩම සම්බන්ධයෙන් මැදිහත්වීම සිදුකළ යුතු වන්නේ දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව බවත්, මෙම ඉඩම අවසතු කිරීමට අදාළ ගැසට් නිවේදනය අවලංගු කිරීමට හැකියාවක් පවතී නම් එය ඉතා කාලෝචිත බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගම් පුළුල් කිරීමේ වැඩසටහන යටතේ මෙම ඉඩම රජයට පවරා ගන්නේ නම් ඉඩම අවසතු වූ පුද්ගලයා හට වන්දි මුදල් ගෙවීමට සිදුවන බවත්, අද දිනය වන විටත් මෙම ඉඩමේ සංවර්ධන කටයුතු සිදුකරන බැවින් ඒ සඳහා තහනම් නියෝගයක් ලබාගත යුතු බවත්, එම තහනම් නියෝගය ලබා ගැනීමට ඇති නීතිමය හැකියාව සම්බන්ධව සභාව සොයා බැලිය යුතු බවත් ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ සැලසුම් කමිටුව හරහා මෙම ගැටළුව සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව නීතිඥ උපදෙස් ලබා ගත යුතු බවටත්, මේ සියළු කටයුතු අධිකරණය හරහා බේරා ගැනීමට සිදුවන බවත්, මේ වන විටත් මෙම ඉඩම සම්බන්ධව පවරා ඇති නඩුවට සභා අරමුදලින් විශාල මුදලක් ගෙවා ඇති බවත්, මෙම නඩුව සභාව පරාජය වුවහොත් නඩු ගාස්තු පවා ගෙවීමට සිදුවන බවත්, මෙම නඩුවට පෙනී සිටින නීතිඥ මහතා මුණ ගැසී කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දුන්නද කිසිදු ගරු සභිකවරයෙකු එම අවස්ථාව ලබා නොගත් බවත්, එම නිසා ඉදිරියේදී හෝ එම නීතිඥතුමා මුණගැසී තමන් සතුව ඇති කරුණු ගරු සභිකවරු විසින් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම වංචාවක් බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම අවසතු කිරීමට අදාළව නඩු නිමිත්තක් නොමැති බවට සභාව වෙත දැනුම් දී ඇති බවත්, ගාල්ලේ පිහිටි අධිකරණ දෙකකදී මෙම ඉඩම අවසතු කිරීම සම්බන්ධව පැවති නඩු දෙකක් නිශ්ප්‍රභා කළ බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධව තමා ඇතුළු පිරිසක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිරීමට ගිය අවස්ථාවේදී මේ සම්බන්ධව නඩු නිමිත්තක් ඇති බැවින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන බවට දැනුවත් කළ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත හිටපු ගරු සභාපති පද්මසේන මාවැල්ල මැතිතුමා කරන ලද පැමිණිල්ලකට අදාළව නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ඉල්ලා යැවූ විට කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධව නඩු නිමිත්තක් නොමැති බවට නීතිපති දෙපාර්තමේන්තුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනම් දී ඇති බැවින් මේ සම්බන්ධව තවදුරටත් කටයුතු නොකරන බවට සභාව වෙත දැනුම් දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

දේශපාලන අධිකාරියට මෙම ගැටළුව විසඳීමට වුවමනාවක් තිබේ නම් කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධව ඇති ගැසට් නිවේදනය අවලංගු කිරීමට හැකියාව ඇති බවත්, එම නිසා මේ පිළිබඳව සභා යෝජනාවක් සම්මත කරගෙන මෙම ගැසට් නිවේදනය අවලංගු කරන ලෙස අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා හමුවී සාකච්ඡා කළ යුතු බවත්, මෙම ඉඩම අනවසරයෙන් සංවර්ධනය කිරීම පිළිබඳව අධිකරණයෙන් තහනම් නියෝගයක් ලබාගත යුතු බවත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කිසිම දේශපාලන නායකයෙකු වෙතින් මෙම ඉඩම රජයට පවරා ගැනීම සම්බන්ධව සහයෝගය බලාපොරොත්තු විය නොහැකි බවත්, ගරු ස්වාමීන් වහන්සේලා පවා මෙම ඉඩම අවසතු වූ පුද්ගලයා වෙනුවෙන් පෙනී සිටින බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව නීතිය මගින් විසඳා ගැනීමට පහසු කටයුත්තක් නොවන බවත්, මෙම ඉඩම අවසතු කිරීම යුක්ති සහගත නොවන බවත්, මෙම ඉඩම අවසතු කිරීම සම්බන්ධව තීරණය ගත යුත්තේ පාර්ලිමේන්තුව තුළින් හෝ කැබිනට් මණ්ඩලය තුළින් බවත්, කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ළමුන්ගේ පරිහරණය සඳහා පැවති ඉඩම අවසතු වීම වැරදි බවත්, මෙම ඉඩම නැවත ජනතාව සතු කළ යුතු බවත්, ඒ සම්බන්ධව මෙම සභාවටද වගකීමක් ඇති බවත්, මෙම කාරණය සම්බන්ධව සභාවේ පොදු එකඟතාවයක් ඇති බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉඩම සම්බන්ධව සභාවට අයිතියක් නැති බවත්, සභාවක් ලෙස මෙම ගැටළුවට මුහුණ දිය යුතු ආකාරය සංකීර්ණ බවත්, මෙම ඉඩම සම්බන්ධව සභාවට පවරා ඇති නඩුවට පෙනී සිටින නීතිඥ මහතා සමග තමා සාකච්ඡා කළ බවත්, ජනතාවගේ ඉල්ලීම අනුව සභාව විසින් මෙම ගැටළුවට මැදිහත් වූ බවට ඔප්පුකළ හැකි විය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

<u>02. වෙන්දේසි කිරීමට යෝජිත ගිංතොට තුනී ලෑලි කර්මාන්ත ශාලාව පිහිටි භූමිය සම්බන්ධව</u>

ගිංතොට, තුනී ලෑලි සංස්ථාව පිහිටි ප්‍රදේශයේ ඇති වටිනාකමින් ඉතා ඉහළ ඉඩමක් වන බැවින් එම ඉඩම නැවත රජයට පවරාගෙන නිෂ්පාදන කටයුතු වලට යොමුකළ යුතු බවත්, එය සභාවට ලැබෙන ගෞරවයක් බවත්, රජය සතු සංස්ථාවල සිදුවන මෙවැනි අවසතුවීම් පිළිබඳව විරුද්ධ විය යුතු බවත්, ගිංතොට, තුනී ලෑලි සංස්ථාව පිහිටි ඉඩම සම්බන්ධව ලිපිගොනුවක් තමා සතුව නොමැති බවත්, එම ඉඩමේ පර්චස් ගණන කොපමණද යන්න හෝ පර්චස් එකක් විකුණන ලද මුදල කීයක්ද යන වග හෝ තමන් නොදන්නා බවත්, එම ඉඩමේ පිහිටි යකඩ විකුණා එම ඉඩම මිලදී ගත් මුදල සොයා ගත හැකි බවත්, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉඩමද සභාව සතු ඉඩමක් නොවන බවත්, සභා බල ප්‍රදේශය තුළ පවතින ඉඩමක් පමණක් වන බවත්, එම ඉඩමට ලබාදී තිබූ ඉඩම් අනුබෙදුම් බලපත්‍රය අවලංගු කිරීම නිසා මේ වන විට සභාවට එරෙහිව නඩු පවරා ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ගැටළුවද කාලයක් තිස්සේ සභාවට යොමුවන ගැටළුවක් වන බවත්, මෙම ඉඩම සභාවට පවරාගැනීමට අදාළව ව්‍යාපෘති වාර්තාවක් සකස්කොට ඉදිරිපත් කරන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සභාවට දැනුම් දී ඇති බවත්, මේ වන විට ඉඩමක් කොටස්කොට විකුණා ඇති බවත්, මෙම ඉඩම විකිණීම පිළිබඳව විරෝධතා දැක්වීම් පවා පැවැත්වූ බවත් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ඉඩම රුපියල් ලක්ෂ අසූපහකට ලබාදී ඇති නමුත් එම ඉඩමේ පර්චස් එකක නියම වටිනාකම රුපියල් ලක්ෂ හයක් පමණ වන බවත්, මෙම ඉඩමේ අක්කරයක පමණ ඉඩම් කොටසක් විකුණා ඇති බවත්, මහනායක හිමිවරු ඇතුළු ස්වාමීන් වහන්සේලා කිහිපනමක්ද මෙම ඉඩම නව හිමිකරු වෙත ලබා ගැනීම වෙනුවෙන් පෙනී සිටින බවත්, ඉඩමේ නියම වටිනාකම තක්සේරු කිරීමක් සිදු නොකොට මෙම ඉඩම අවසතු කොට ඇති බවත්, එම නිසා මේ පිළිබඳව සභා තීන්දුවක් ලබාගෙන අතිගරු ජනාධිපතිතුමා සහ ගරු

අගමැතිතුමා හමුවී දැනුවත් කළ යුතු බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉඩම සඳහාද කළ යුතු වන්නේ අවසතු කරන ලද ක්‍රමවේදයට විරුද්ධවීම බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගිංතොට තුනී ලෑලි සංස්ථාව පිහිටි ඉඩම සභාවට අත්පත් කර ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළද එය සභාවට ලබා ගැනීමේදී මුදල් ගෙවා ලබා ගැනීමට සිදුවන බවත්, මෙය මහජන දේපලක් වන බැවින් නැවත මෙම ඉඩම ජනතාව සතු කළ යුතු බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගිංතොට තුනී ලෑලි සංස්ථාව පිහිටි ඉඩම අවසතුවීම සම්බන්ධව සහ කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධව ඇති නීතිමය තත්ත්වයන් පිළිබඳව ගරු සභිකවරුන් දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>කාරක සභා අවස්ථාව</u>**

කාරක සභා අවස්ථාවේදී පළාත් පාලන සහකාර කොමසාරිස් (ගාල්ල) කාර්යාලය නියෝජනය කරමින් පැමිණි විමර්ශන නිලධාරි උදයසිරි මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- ප්‍රාදේශීය සභා පනතේ 19, සහ 129 සහ 131 යන වගන්ති තුන අනුව ප්‍රදේශීය සභාවක් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව සඳහන්කොට ඇති බව
- 19, 38 සහ 39 යන වගන්ති අනුව ප්‍රාදේශීය සභාවක් වෙත ඉඩමක් අත්පත් කර ගැනීමට, මිලදී ගැනීමට හෝ ත්‍යාගයක් ලෙස ලබා ගැනීමට බලය ඇති බව
- 1964 - 460 වැනි අධිකාරිය යටතේ ඉඩම් අත්පත්කර ගැනීමේ පනත යටතේ රජයට ඉඩම් අත්පත් කරගත යුතු බවත්, එය ඉඩම් අමාත්‍යාංශය විසින් සිදුකළ යුතු බව
- ප්‍රදේශීය සභාවකට ඉඩමක් අත්පත් කර ගැනීමට අවශ්‍ය නම් සභා සම්මුතියක් ලබාගෙන එය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමුකළ යුතු බව
- කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සතුව පැවති ඉඩම සහ ගිංතොට තුනි ලෑලි සංස්ථාව සතුව පැවති ඉඩම යන ඉඩම් දෙකම අවසතු කොට ඇති බැවින් එම ඉඩම් දෙක සඳහාම මේ වන වනවිට අයිතිකරුවන් සිටින බව
- මෙම ඉඩම් දෙක අවසතු කිරීමේදී යම් වරදක් සිදු වී ඇත්නම් එය ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කළ යුතු ගැටළුවක් වන නමුත් ප්‍රාදේශීය සභාවට පැවරෙන වගකීමක් නොවන බව
- බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍යතාවයක් පවතී නම් එම කාර්යය සිදුකළ හැකි නමුත් රජයේ වෙනත් දෙපාර්තමේන්තුවක් යටතේ ඇති ආයතනයක් වෙනුවෙන් ප්‍රාදේශීය සභාවකට පෙනී සිටීමට හැකියාවක් නොමැති බවත්, ඒ සඳහා සභා අරමුදල් වියදම් කිරීමට හැකියාවක් නොමැති බවත්, බල ප්‍රදේශය තුළ පිහිටි යම් ඉඩමක් සභාව වෙත අත්පත්කර ගැනීමක් සිදුකළහොත් හෝ මිලදී ගැනීම සිදුකලහොත් හෝ ත්‍යාග ලෙස ලැබුණොත් හෝ එම ඉඩම රජයේ හෝ පුද්ගලික අංශය වෙත බැහැර කිරීමට හැකියාවක් නොමැති බවත්, සේවා අවශ්‍යතාවය මත පමණක් හිලව් කිරීමක් පමණක් සිදුකල හැකි බව
- කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ඇති පාසලක් වන බැවින් අවසතු කරන ලද ඉඩම නැවත පාසලට අවශ්‍ය නම් ඒ පිළිබඳව අවශ්‍ය ඉල්ලීම කළ යුතු වන්නේ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් බව
- දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් කළ යුතු කාර්යයක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේදී යෝජනා සභා සම්මත කිරීම වැරදි බවත්, එය වලංගුතාවයක් නොමැති සභා සම්මුතියක් බවත්, දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව හරහා එවැනි යෝජනා සඳහා ඉදිරි කටයුතු වලට යොමු නොකරන බව
- සංවර්ධන කටයුතු සඳහා සභාවට මුදල් ගෙවා ඉඩම් අත්පත්කර ගැනීමට හැකියාව ඇති බව
- කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධ ගැසට් නිවේදනය අවලංගු කිරීමට ඉල්ලීම් කළ යුත්තේ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් බවත්, බල ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු සම්බන්ධව ක්‍රියාකිරීමට ප්‍රාදේශීය සභාව වෙත ප්‍රාදේශීය සභා පනතෙන් බලයක් ලැබී නොමැති බැවින් එය ප්‍රාදේශීය සභාව විසින් කළ යුතු කාර්යයක් නොවන බව

- කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ විදුහල්පතිවරයා එම ඉඩම පාසලට අවශ්‍ය නොවන බවට ලබාදී ඇති ලිපිය මත පදනම්ව පමණක් මෙම ඉඩම නොවන බවත්, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය, කලාප අධ්‍යාපන කාර්යාලය, ගාල්ල අධ්‍යාපන කොමසාරිස් කාර්යාලය, දකුණු පළාත් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යන ආයතනවලද නිර්දේශ ලබාගෙන ඉඩම් අමාත්‍යාංශය හරහා එම ඉල්ලීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පැමිණිය යුතු බව
- එම ඉඩමට ලබාදී තිබූ සංවර්ධන බලපත්‍රය අවලංගු කිරීම හේතුවෙන් සභාපතිතුමා වෙත රිට් ආඥාවක් ලබාගැනීමට කොළඹ අභියාචනාධිකරණයේ නඩු පවරා ඇති බව
- එම රිට් ආඥාව ලබා ගනු ලබන්නේ නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුව බවත්, නාගරික සංවර්ධන අධිකාරි පනත ප්‍රාදේශීය සභා පනත ඉක්මවා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා බලපාන බව
- 2008 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියේ, නාගරික සංවර්ධන අධ්‍යක්ෂක ජනරාල්වරයා හට ඇති බලතල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට විශේෂ ලිපියකින් ලබා දී ඇති බවත්, එම ලබාදී ඇති බලතල ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම පිළිබඳ බලය ඇත්තේ සභාපතිවරයාට හෝ ලේකම් වරයාට හෝ මිස මහා සභාවට නොවන බව
- ඉඩම් කට්ටි කැබලි කිරීම සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවක් හෝ සෑදීමට පවා ප්‍රාදේශීය සභාවට බලයක් නොමැති බව
- ලබාදී ඇති බලතල අනුව සැලසුම් කමිටුව යම් සැලසුමක් අනුමත කළහොත් එය අනුමත කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බැඳී සිටින බව
- ලබා දී සංවර්ධන බලපත්‍රය අනුව කටයුතු නොකිරීම නිසා එම සංවර්ධන බලපත්‍රය අවලංගු කිරීමට හැකියාව ඇති බවත්, සභා තීන්දුවක් ලබාගෙන සැලසුම් කමිටුව මගින් ලබාදී ඇති සංවර්ධන බලපත්‍රයක් අවලංගු කිරීමට හැකියාවක් නොමැති බව
- කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලය සතුව පැවති අවසතු වූ ඉඩම කට්ටි කිරීම සම්බන්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නම් නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් අනුව සභාපතිවරයා විසින් කටයුතු කළ යුතු බව
- රජයට ඉඩමක් අත්පත් කර ගැනීමේදී ඉඩමක පූර්ණ අයිතිය තහවුරු කිරීමක් සිදුකළහොත් පමණක් වන්දි මණ්ඩලයක් හරහා වන්දි ලබාදීම සිදුවන බව
- ගරු සභාපතිවරයා ලෙස පවරා ඇති නඩුව පරාජය වුවහොත් නඩු ගාස්තු ගෙවීමට සිදුවන්නේ ගරු සභාපතිවරයාගේ පෞද්ගලික මුදල් වලින් බව
- ප්‍රාදේශීය සභාව විත්තිකරුවෙකු කොට නඩුවක් පැවරූ විට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතින් රජයේ මුදල් වියදම් කිරීමට අවසරය ලබාගත යුතු බව
- ගිංතොට තුනී ලෑලි සංස්ථාව විකිණීම හේතුවෙන් බල ප්‍රදේශයේ ජනතාව විරැකියාවෙන් පෙලෙන බවත්, එය බලප්‍රදේශයේ ජනතාවට බලපාන ප්‍රශ්නයක් බැවින් එම ඉඩම සභාවට පවරා ගැනීමට හැකියාව ඇති බවත්, ඉන්පසු ව්‍යාපාර කටයුතු ආරම්භකොට රැකියා උත්පාදනය කළයුතු බව
- මීට අමතරව ගිංතොට තුනී ලෑලි සංස්ථාව පිහිටි ඉඩම අවසතුවීම සම්බන්ධව සහ කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ සතුව පැවති ඉඩම අවසතුවීම සම්බන්ධව ගරු සභිකවරුන්ට ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අවසන් කිරීමට කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## 03. පහත් බිම් ගොඩකිරීම් සම්බන්ධව

ගොඩකන්ද, සමරජීව මහජන පරීක්ෂක මහතාගේ නිවස අසළ කාණුවට හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීම පිළිබඳව විරෝධයක් සභාව වෙත එල්ල වී ඇති බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ගැටළුව පිළිබඳව ගරු සභිකවරු දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

## කාරක සභා අවස්ථාව

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි ජේ.පී.පී.එස්. ගුණවර්ධන මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- මෙම ස්ථානයේ මායිම් පිළිබඳ ගැටළුවක් ඇති බව
- ඉඩම හිමි පුද්ගලයා තම ඉඩමේ මායිම් නියමාකාරව නොදන්නා නිසා මෙම ගැටළුව පැන නැගුණ බව

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අවසන් කිරීමට කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උළුවිටිකේ, පියසේන මහතාගේ ගැටළුව තවම විසඳී නොමැති බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම ස්ථානයේ ඇති ගැටළුව පිළිබඳව තමා දෙවතාවක් ස්ථානීය පරීක්ෂණයක් සිදුකළ බවත්, එම මාර්ගයේ අවසාන කොටසේ ළිදක් පවා පිහිටා ඇති බවත්, එම මාර්ගයේ අවසාන කොටස පියසේන මහතා විසින් භුක්ති විඳින බවත්, එම පාරට සමාන්තරව කාණුවක් කැපීම මගින් මෙම ගැටළුව විසඳීමට හැකි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම කන්දේ සිට ගලාගෙන පැමිණි ජල පහර දැනට ගොඩකරන ලද ඉඩම හරහා ගලාගිය බවත්, එම මාර්ගය සංවර්ධනය කරන ලද කාලසීමාවේදී පවා ළිඳ පිහිටා තිබූ බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගොඩකරන ලද ඉඩම හරහා කාණුවක් තිබූ බවට මිනින්දෝරු සැලසුම්වල පවා සඳහන් වන්නේ නොමැති බවත්, මෙම ගැටළුව පවුල් ආරවුලක් මත හටගෙන ඇති බවත්, මෙම ගැටළුව විසඳීම සඳහා මාර්ගයට සමාන්තරව කාණුවක් කපා කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කර දීමට වුවද හැකි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

බෝගහවේල්ල ප්‍රදේශයේ පැවති කුඹුරු ඉඩම් ගොඩකර නිවාස සෑදීම නිසා වර්ෂා කාලයට නිවාස සහ මාර්ග ජලයෙන් යටවීම සිදුවන බවත්, එම ඉදිකිරීම් මාර්ගයේ සිට තැබිය යුතු ඉඩ පවා නොතබා ඉදිකර ඇති බවත්, ජස්ටින් කන්දේ සිට ගලා එන ජලය මෙම ප්‍රදේශය හරහා ගමන් කරන  බවත්, එම කාණුවේ පැති බැම්ම ඉදිකිරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව දැනුවත් කළ යුතු බවට ප්‍රකාශ කළ බවත්, වැලිකැටිය වත්ත මාර්ගය ගිලා බැසීමට ලක්වන බැවින් මෙම පැති බැම්ම කඩිනමින් ඉදිකළ යුතු බවත් ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කුඹුරු ඉඩම් ගොඩකිරීම සම්බන්ධව නීතිමය කටයුතු කල යුත්තේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වර්ෂා කාලයේදී වක්වැල්ල, ඕපාත වැනි ප්‍රදේශවල කුඹුරු ඉඩම් සියල්ල ජලයෙන් යටවන බවත්, ගිංගඟ සහ කැපූ ඇළ එම ප්‍රදේශයෙන් ගමන් කරන නිසා මෙම තත්ත්වය ඇතිවන බවත්, පහත්බිම් ගොඩකිරීම සිදුකරන නිසා ගොඩ ඉඩම් පවා ජලයෙන් යටවීමේ ප්‍රවණතාවය වැඩිවී ඇති බවත්, මේ හේතුව නිසා ඩෙංගු සහ මී උණ වැනි විවිධ රෝගාබාධ පවා වැඩිවීමක් දක්නට ලැබෙන බවත්, මේ සම්බන්ධව සභාව මැදිහත් වී ක්‍රියා කරන අතරවාරයේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවද දැනුවත් කළ යුතු බවත්, බෝක්කු වල පස් පිරීම නිසා එම පස් ඉවත් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවත්, එමගින් මාර්ග ජලයෙන් යටවීම හා කාණු උතුරායාම වලක්වාගත හැකි බවත්, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ප්‍රකාශ කරන ලදී.

කොට්ඨාශ මට්ටමින් පවිත්‍රතා කටයුතු සඳහා සේවකයින් ලබාදුන් විට එම කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කල යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට නීතිය ක්‍රියාත්මක කළ නොහැකි මට්ටමට පහත්බිම්වල පරිසරය මේ වන විට වෙනස් වී ඇති බවත්, ගොඩ ඉඩම් නාමලේඛනයට පහත්බිම් ඇතුළත් කිරීමේදී සලකා බලනු ලබන සාධක කාලයත් සමග සාධනීය ලෙස ගැලපී ඇති බවත්, 1980ට පෙර කුඹුරු, ඕවිට සහ කලවිටි ලෙස හඳුන්වනු ලැබූ පහත්බිම් කොටස් ක්‍රමක්‍රමයෙන් අඩුවී ඇති බවත්, වගා කටයුතු වලින් මිනිසුන් ඈත්වීම ඊට හේතු වී ඇති බවත්, පහත්බිම් කුණු යොදා, ගස්වල කපන ලද දැව කොටස් සහ අතු කැබලි යොදා සහ පස් යොදා ගොඩකරන බවත්, පහත් බිමක් ගොඩ ඉඩම් නාමලේඛනයට ඇතුළත් කිරීමේදී කමිටුවක් මගින් නිර්දේශ ලබාදෙන බවත්, එහිදී ඉඩමේ පිහිටා ඇති ගස් සඳහා විශේෂ කොට සලකා බලන බවත්, එම ගස්වල වයස නිර්ණය කොට ඉඩම අස්වද්දීමෙන් වැළකී සිටි කාලය උපකල්පනය කරන බවත්, පොහොර සහ වෙනත් ආධාර ලබා ගැනීමෙන් වැළකී සිටි කාල සීමාවද සලකා එම නිර්දේශ ලබාදෙන බවත්, පහත්බිම් ගොඩ ඉඩම් නාමලේඛනයට ඇතුලත් කිරීමේදී දැනට භාවිතා කරනු ලබන ක්‍රියාමාර්ගවලට වඩා දියුණු

තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු බවත් ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

පහත්බිම් ගොඩකිරීම නිසා ඇතිවන ගැටළු සභාවට යොමුවන බැවින් ප්‍රාදේශීය සභා පනතෙන් පැවරී ඇති බලතල අනුව මේ සඳහා විධිමත් යාන්ත්‍රණයක් සකස්කල යුතු බවත්, සභාවට පැමිණෙන ගැටළු වලින් බහුතරයක් පැමිණෙන්නේ ඉඩම ගොඩකළ පසුව බවත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා පාර්ලිමේන්තුව මගින් බලය ලබාදී ආයතන ඒකාබද්ධ කිරීමක් සිදුකළ යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

## 04. අනවසර ඉදිකිරීම් සම්බන්ධව

මාම්පිටිය පාලම අසළ ඇති අනවසර ඉදිකිරීම සම්බන්ධව නීතිඥ මහතා විසින් සභාව වෙතින් වාර්තාවක් ඉල්ලා ඇති බවත්, එම වාර්තාව තවම නීතිඥ මහතා වෙත ලැබී නොමැති බවට තමා වෙත දැනුම් දුන් බවත්, එබැවින් ඒ පිළිබඳව අවධානය යොමුකළ යුතු බවට ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

හිරිඹුර, පැතුම් උයන ලිපිනයේ පදිංචි බාන් මහතාගේ අනවසර ඉදිකිරීම සම්බන්ධව සභාව විසින් පවරන ලද නඩුව බාන් මහතා පරාද වූ බැවින් එම අනවසර ඉදිකිරීම කඩා ඉවත්කොට, ඉඩම පුරවන ලද පස් ඉවත් කරන ලෙස නඩු තීන්දුව ලබාදී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම ඉඩම හරහා කාණුවක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට මුල්දී බාන් මහතා එකඟතාවය පළ නොකළද, මෙම නඩුව යන අතරවාරයේදී ඒ සඳහා එකඟතාවය ලබාදුන් බවත්, එම ඉඩම හවුල් ඉඩමක් වන බැවින් බාන් මහතාට සිය නිවසේ සැලැස්ම සභාව වෙතින් අනුමතකොට ගෙන නීත්‍යානුකූල කර ගැනීමට නොහැකි වූ බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

හපුගල ග්‍රෑන්ඩ් පැනරෝමා ඉඩමේ ඇති තට්ටු තුනේ නිවස පිළිබඳව මෙතෙක් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත්, හපුගල යනු අනවසර ඉදිකිරීම් කලාපයක් වන බවත්, හපුගල හන්දියේ ට්‍රාන්ස්පෝමරය යටද අනවසර ඉදිකිරීමක් සිදුකර ඇති බවත්, හපුගල කාගිල්ස් ෆුඩ්සිටිය පිහිටා ඇති ගොඩනැගිල්ලද අනවසර ඉදිකිරීමක් බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

හපුගල කාගිල්ස් ෆුඩ්සිටිය පිහිටා ඇති ගොඩනැගිල්ල සභාව විසින් අනුමත කොට ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

බලප්‍රදේශයේ ඇති මෙම අනවසර ඉදිකිරීම් සඳහා තහනම් නියෝගයක් ලබාගත යුතු බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

හපුගල හන්දිය සංවර්ධනය වීම පිළිබඳව තමා සතුටු වන බවත්, හපුගල හන්දියේ මෙම ඉදිකිරීම් පිළිබඳව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා හැර වෙනත් පුද්ගලයන් සභාවට පැමිණිලි නොකරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

හපුගල හන්දිය පැවති තත්ත්වයට වඩා අදවන විට දියුණු වී ඇති බවත්, හපුගල හන්දියේ නව ඉදිකිරීම් සිදුකරන විට පාර මැද සිට අඩි 50ක සීමාවක් තැබිය යුතු වුවද, ඉදිකරන ලද මෙම ගොඩනැගිලිවල එම සීමාව තබා නොමැති බවට ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

## 05. ප්‍රශ්නගත කපා ඉවත් කරන ලද කොස් ගස සම්බන්ධව සාකච්ඡා කොට තීරණයක් ගැනීම

මෙම ප්‍රශ්නගත කොස්ගසෙන් ඇති අනතුර ඉවත්කිරීම සඳහා ගස කපා කොස් කොටන් ටික ආරක්ෂාව සඳහා සභාවට ගෙනැවිත් දමා ඇති බවත්, එම කොස්ගසෙහි අයිතිකරු ඉදිරිපත් වූ පසු සභාවට වැයවූ මුදල් අයකර ගැනීමෙන් පසු එම කොස් කොටන් ටික ලබාදෙන බවත්, ප්‍රාදේශීය ලේකම් වෙතින් එම කොස්ගසෙහි අයිතිකරු තහවුරු කරදෙන ලෙස ඉල්ලා ඇති බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම කොස්ගස කැපීම සඳහා දින 14ක් වලංගු කැපුම් බලපත්‍රයක් ලබාදී ඇති අතර එම බලපත්‍රය නැවත දින නියමයක් රහිතව දින දීර්ඝ කර ඇති බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ඉඩමට මායිම් නඩුවක් ඇති බවත්, මෙම කොස්ගස සඳහා හිමිකම් කියනු ලබන පාලිත අමරවර්ධන මහතා හට ප්‍රවේශතා අයිතිය පමණක් ලබාදී ඇති බැවින් නැවත අධිකරණය වෙත ගොස් ප්‍රවේශතා අයිතිය ඉවත් කරගැනීම සිදුකළ යුතු බවත්, කොස්ගසක් කපා හෙලීම සඳහා බලපත්‍රය හවුල් ඉඩමක පිහිටි කොස්ගසක් සඳහා වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ලබාදුන්නද, ප්‍රවාහන බලපත්‍රය ලබා නොදෙන බවත්, මෙම කොස්ගස සභා අරමුදලින් කපා අනතුර ඉවත් කිරීමට පෙර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කිරීමට අතපසුවීම සභාවේ අඩුපාඩුවක් බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කොස්ගස කැපීම සඳහා කැපුම් බලපත්‍රය පාලිත අමරවර්ධන මහතා හට ලබාදී ඇති බැවින් එම කොස් ගසෙහි අයිතිය තහවුරු වන බවත්, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

අඩි 04ක මාර්ගයක මෙම අනතුරුදායක කොස්ගස පිහිටා තිබුණ බවත්, ඒ ආසන්නයේ පිහිටි චමින්ද මහතාගේ නිවසට මෙම කොස්ගස අනතුරුදායක තත්ත්වයක් තිබුණ බැවින් තමා විසින් මෙම කොස්ගස කපා ඉවත් කිරීම සඳහා සභාවට යෝජනා කල බවත්, පාලිත අමරවර්ධන මහතා හට මෙම කොස්ගස කැපීමෙන් පසු ප්‍රවාහන බලපත්‍රය ලබා නොදීම නිසා කොස්ගස කැපීම සිදු නොකළ බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම ප්‍රශ්නගත කොස්ගස කපා ඉවත් කිරීම සම්බන්ධව ඇති නීතිමය තත්ත්වයන් පිළිබඳව ගරු සභිකවරුන් දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී පළාත් පාලන සහකාර කොමසාරිස් (ගාල්ල) කාර්යාලය නියෝජනය කරමින් පැමිණි විමර්ශන නිලධාරි උදයසිරි මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- පෞද්ගලික ඉඩමක ඇති දේපලකට හානිදායක ගසක් පවතී නම් එම නිවසේ හිමිකරු විසින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත කරන ලද දැන්වීමක් අනුව සභාපතිවරයා විසින් පැය 48ක් ඇතුළත ඒ ගැන ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රාදේශීය සභා පනතෙන් බලය ලබාදී ඇති බවත් එම බලය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට නිලධාරීන්ගේ සහාය ලබාගත යුතු බව
- රජයේ ඉඩමක පවතින ගසකින් අනතුරුදායක තත්ත්වයක් පවතී නම් එම ගස කපා බිම හෙලා සභා සම්මුතියක් ලබාගෙන වැයවූ මුදල එම ගස වෙන්දේසි කිරීමෙන් අයකරගත යුතු බව
- පෞද්ගලික ඉඩමක පවතින ගසකින් අනතුරුදායක තත්ත්වයක් පවතී නම් එම ගස කපා බිම හෙලා, ගස කැපීමට වැයවූ මුදල ගසෙහි අයිතිකරුගෙන් අයකර ගත යුතු බව
- යම් ගසක් කැපීමට ප්‍රාදේශීය ලේකම් වෙතින් අවසර ලබාගත යුතු නම් එම ගස කැපීමට පෙර ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම්දීම සිදුකල යුතු බව
- මෙම කොස්ගස කැපීම සම්බන්ධව පාලිත අමරවර්ධන මහතා විසින් දකුණු පළාත් පළාත් දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත්කොට ඇති බව
- යම් ඉඩමක ප්‍රවේශතා අයිතිය පමණක් ඇති විට එම ඉඩමේ අයිතිය හිමි නොවන බවත්, හිමිවන්නේ ඉඩමට ප්‍රවේශවීමේ අයිතිය පමණක් බව
- ගසකින් ඇති අනතුර පැහැදිලිව හඳුනාගත නොහැකි නම් ගසෙහි උසෙන් අඩි 16ක් තබා ගසෙහි ඉතිරි කොටස සහ අතු කැපීම මගින් අනතුරදායක තත්ත්වය ඉවත් කළ හැකි බව
- පෞද්ගලික ඉඩම්වල කපන ලද ගස් ආරක්ෂා කිරීමට ග්‍රාම නිලධාරීන් බැඳී නොසිටින බව
- මීට අමතරව මෙම කොස්ගස කපා ඉවත් කිරීම සම්බන්ධව ගරු සභිකවරුන්ට ඇති ගැටළු සාකච්ඡා කරන ලදී.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අවසන් කිරීමට කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u> ෘ-**

I. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
II. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
III. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
IV. ගරු මන්ත්‍රීනි ඩී.පී. වාසනා උදයංගනී මැතිණිය
V. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

විශේෂ මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 05.15 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.